# ශිලාලේඛන හා සාහිත්‍ය මූලාශ්‍රය තුළින් හෙළිවන අරියවංස සූත්‍ර දේශනා උත්සවය පිළිබඳ විමසුමක්

කැලේගම ජිනරතන හිමි[1], ඉනෝජ් කෞශල්‍ය අබේනායක[2]

## හැඳින්වීම

ශ්‍රී ලාංකේය සමාජයෙහි ආධ්‍යාත්මික චින්තනය සකස් වීම කෙරෙහි ප්‍රමුඛ බලපෑම සිදුව ඇත්තේ බුදු සමය තුළින් බව වංසකථාගත හා ශිලාලේඛනගත තොරතුරු අනුව පැහැදිලි වේ. එසේ ම මිහිඳු තෙරුන්ගේ ආගමනයට පෙර මෙරට පැවති ආගමික හා වෙනත් විශ්වාස තුළින් ද මේ සඳහා යම් බලපෑමක් සිදුව ඇතැයි අනුමාන කළ හැකි ය. බුදුසමය මෙරට ව්‍යාප්ත වීම ඇරඹීමත් සමඟ උත්සව හා පූජා විධි ද වර්ධනය වී තිබේ. එසේ වර්ධනය වූ පූජා විධි හා උත්සව දියුණුවට පත්ව තිබෙන්නේ පොදු ජනතාවගේ අභිමතය අනුවය. ගිහි ප්‍රජාවේ බහුතරය බුදුරජාණන්වහන්සේගේ දේශනා තුළ අඩංගු ධර්ම කරුණු වටහා ගන්නට හෝ ඒවා අනුගමනය කරන්නට නොහැකි වුව ද තම ආගම ධර්මය කෙරෙහි දැඩි ගෞරවයක් සහිත හැඟීමකින් කටයුතු කොට ඇත. එනිසා එවැනි පිරිසකට තම ආගමික හැඟීම් ක්‍රියාවට නගාගැනීම සඳහා යම් ක්‍රමවේදයක් අවශ්‍ය වී ඇත. ආධ්‍යාත්මික චරිත සංවර්ධනය සඳහා ඔවුන්ට අවැසි වූයේ තම ඉන්ද්‍රියන් පිනවන, ඇසින් දැකිය හැකි දේවල්ය. ඔවුන්ගේ මෙම අවශ්‍යතාව ඉටු කරගනු ලද්දේ වත් පිළිවෙත්, පුද සිරිත් හා උත්සව ආදිය නිර්මාණය කරගැනීමෙනි. පෞරාණික සමාජයෙහි පැවති එවන් අවශ්‍යතාවක් පිරිමසා ගැනීම සඳහා බිහිකරගන්නා ලද ආගමික උත්සවයක් වශයෙන් අරියවංස සූත්‍ර දේශනා උත්සවය හැඳිනගත හැකි ය. මෙම අධ්‍යනයෙන් සිදු කෙරෙන්නේ ශිලාලේඛන ආශ්‍රයෙන් ඒ පිළිබඳ විමසා බැලීමකි.

## පර්යේෂණ අරමුණ

මෙරට සංස්කෘතියෙහි ප්‍රධාන පැතිකඩක් නියෝජනය වනුයේ අස්පර්ශිත සංස්කෘතිය තුළිණි. එසේ වුවද වර්තමානයේ දී එයට අයිති අස්පර්ශිත උරුමය පිළිබඳ අධ්‍යයනවලට වඩා ප්‍රමුඛත්වය හිමිව ඇත්තේ ස්පර්ශිත හෙවත් භෞතික උරුමය පිළිබඳ ව ය. අස්පර්ශිත උරුමයේ වටිනාකම් හැඳිනගෙන ඒවා මතු පරපුර වෙත උරුම කිරීම අද්‍යතනයේ කාර්යභාරයකි. මෙම අධ්‍යයනයේ අරමුණ වන්නේ අවධානයෙන් ගිලිහී ඇති අස්පර්ශි අධ්‍යයනය කොට අනාගතය කරා රැගෙන යාමේ අවශ්‍යතාව පෙන්වා දීමය.

1. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුරය. jinarathana@busl.ac.lk
2 ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය. inojabey@gmail.com

**පර්යේෂණ ගැටලුව**

ශ්‍රී ලාංකේය අස්පර්ශිත සංස්කෘතියේ සුවිශේෂී පැතිකඩක් නියෝජනය කෙරෙන බෞද්ධ ආගමික උත්සවවල පැවති එක් අංගයක් ලෙස අරියවංස සූත්‍ර දේශනය හැඳිනගත හැකි ය. ක්‍රි.පූ යුගය නියෝජනය වන ශිලාලේඛන තුළ හා සාහිත්‍ය කෘති තුළ මෙම උත්සවය පිළිබඳ තතු සංගෘහිතය. මෙම දේශනය මඳ වශයෙන් වර්තමානයේ දී ද දැකගත හැකි ය. මෙම පර්යේෂණයෙහි ගැටලුව වන්නේ ඉතා ඈත අවධියක ආරම්භ වූ මෙම උත්සවය වර්තමානය කරා පැමිණීමේ දී එහි මූලයන් වර්තමානයේ දී ආරක්‍ෂා වී පවතින්නේ ද යන්නයි.

**පර්යේෂණ ක්‍රමවේදය**

ගුණාත්මක පර්යේෂණ ආකාරය යටතේ සිදු කෙරෙන මෙම පර්යේෂණයේ දී සාධක අනාවරණය කරගැනීමේ විධික්‍රමය වශයෙන් පුස්තකාල අධ්‍යයනය ඔස්සේ සාහිත්‍ය කෘති හා ශිලාලේඛන මූලාශ්‍රය අධ්‍යයනය කොට ලැබෙන සාධක එම ශිලාලේඛන හා සාහිත්‍ය කෘති සමඟ සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම සිදු කෙරේ.

**සාකච්ඡාව හා ප්‍රතිඵල**

මෙරට බෞද්ධාගම හා සම්බන්ධ පැරණි කාලයේ ක්‍රියාත්මකව පැවති විවිධ පූජා විධි හා උත්සව සමුදායක් පිළිබඳ තොරතුරු අට්ඨකථා තුළින් හමු වෙයි. මෙම සියලු ආගමික පුද පූජා හා උත්සව මෙරට තුළ දී ම ආරම්භ වූ ඒවා යැයි සිතිය හැකි වන්නේ ඒවා පිළිබඳ ව ත්‍රිපිටකය තුළින් තොරතුරු හමු නොවන බැවිණි (අදිකාරම්, 1963, පි.278). මෙම පුද පූජා හා උත්සව බුදු දහමෙහි හරය හා නොසැසඳෙන්නේ වුව ද බුදු දහම රාජ්‍ය ආගම වශයෙන් රට පුරා ව්‍යාප්ත වීමත් සමඟ සාමාන්‍ය ජනතාව ආගම හා සම්බන්ධකර ගැනීම පිණිස එවැනි දෑ ඇති කරගැනීම අත්‍යවශය වූවකි (රාහුල හිමි, 1962, පි. 278) (මේධානන්ද හිමි, 2006, පි.121).

මේවායින් ඇතැම් අංග ආගමික පරමාර්ථයෙන් සිදු කළ පුද සිරිත් හා උත්සව වශයෙන් පැවතිය ද ඒවා ජනතාව ප්‍රිය කරන ආකාරයෙන් නැටුම්, ගැයුම්, වැයුම් ආදියෙන් යුතු විය. එකල මේවා අතිශයින්ම ජනප්‍රියව පැවති නිසා වෙමැනි අවස්ථා නැරඹීමට දුර බැහැර ප්‍රදේශවල සිට පවා ජනතාව පැමිණි බවට සාධක තිබේ. සමාජීය වශයෙන් සිදු වූ පොදු කටයුතු සියල්ලම පාහේ ආගම සම්බන්ධ කොටගෙන සිදු කරීම එකල පැවති සිරිතය. සාමාන්‍ය ජනයාට විනෝදාස්වාදය සඳහා අවස්ථා අඩු වශයෙන් පැවති පැරණි සමාජයෙහි එම අවස්ථා සලසා දීමත් ඔවුන් තුළ ආගමික හැඟීම් පුබුදු කිරීමත් ආගමික පුද පූජා හා උත්සව තුළින් ම සිදු කරන ලදි (රාහුල හිමි, එම, පි. 278, 279).

අරියවංස සූත්‍ර දේශනය ද දිගු ඉතිහාසයක් සහිත මෙවැනි ආකාරයේ බණ කීමේ උත්සවයකි. අශෝක අධිරාජයාගේ සමයේ දී ඉන්දියාවේ ද මෙය සිදු කොට තිබේ. ඔහුගේ භාබ්‍රෑ නැතහොත් බයිරාට් ශිලා ලේඛනයෙහි ''අලියවසාණි'' යන වචනය සඳහන් ව ඇත (වික්‍රමසූරිය, 1929, පි.68). ඉන් අදහස්කොට ඇත්තේ අරියවංස සූත්‍ර දේශනයයි. මෙය අංගුත්තර නිකායේ සතරවන නිපාතයේ උරුවේල වග්ගයේ එන සූත්‍ර

දේශනයක් වෙයි. මෙම සූත්‍රය දේශනා කිරීම සඳහා පැරණි ලංකාවෙහි මහෝත්සවයක් පැවති බැව් පාලි අට්ඨ කථාවන්හි සඳහන් ව ඇති තොරතුරු හා ශිලාලේඛනවල සඳහන් ව ඇති තොරතුරුවලින් පෙනී යයි. ආරම්භයේ දී උත්සවාකාරයෙන් මෙම සූත්‍රය දේශනා කළ නිසාවෙන් පසු කාලය වනවිට ධර්ම දේශනා උත්සවයක් ලෙසට මෙය ආරම්භ වන්නට ඇති බැව් සිතිය හැකි ය. ක්‍රි:ව. 5 වන සියවසට පෙරාතුව හා පසුව ද මෙය ජනප්‍රිය උත්සවයක් වශයෙන් පැවත තිබී ඇත. ඒ නිසාවෙන් ම ඒ හා සම්බන්ධ පුදසිරිත් පැවැත්වීම සඳහා රජවරු ඇතුළු විවිධ පිරිස් විසින් ගම් බිම් ආදිය පූජා කොට දන් වැට ආදිය පිහිටවූ බව සඳහන් ව ඇත (විමලවංස හිමි, 1964, පි.585) (රාහුල හිමි, 1962, පි.280).

වෝහාරිකතිස්ස රජු (ක්‍රි:ව 269-291) මෙවැනි අරියවංස දේශනා පින්කම් බොහෝ ප්‍රමාණයක් පවත්වා ඒ සඳහා නිරන්තරයෙන් දන්වැට පැවැත්වූ බව මහාවංසයෙයි සඳහන් ව ඇත (මහාවංසය, පරි - 36, ගාථා - 37,38). එසේ ම ඇතැම් පොත්වල සඳහන් කරුණු අනුව මෙම උත්සවය අනුරාධපුර යුගයේ දී වැඩි වශයෙන් ජනප්‍රියව පැවති එකක් බව ද පෙනී යයි. දීඝභාණක මහා අභය තෙරුන් වහන්සේ විසින් සිදුකරන ලද අරියවංස දේශනාවක් අසන්නට ස්ත්‍රියක් තම ළදරුවාට තන කිරි පොවමින් පස් යොදුනක් දුර ගෙවා පැමිණි බව මනෝරථපූරණියෙහි සඳහන් ව ඇත. එසේ ම එහි ගවරවාල අංගනයෙහි වස් වාසීව වැඩ සිටි භික්ෂූන් තිස් නමක් විසින් සති දෙකකට වරක් මෙම දේශනාව පැවැත්වූ බැව් ද දැක්වී ඇත. රසවාහිනියෙහි ද මෙම ධර්ම දේශනාව පැවැත්වූ ස්ථාන පිළිබඳ ව තොරතුරු සඳහන් වී ඇත (රාහුල හිමි, 1962, පි.281) (ප්‍රියංක, 2019, පි.41).

අරියවංස හතර ගැන සඳහන් මෙම සූත්‍රය අරියවංස, මහාඅරියවංස, වංස සුත්ත යන නම්වලින් හඳුන්වා ඇත. මෙම සූත්‍රයෙහි

01. භික්ෂුවක් තමා ලත් මොනම සිවුරකින් වුවත් සතුටු වෙයි. මොනම සිවුරක් ගැන හෝ සතුටට පත්වීම පවසයි. සිවුරු ලැබීම පිණිස කිසිම නොපනත් කමක් සිදුනොකරයි. සිවුරු නිසා තමා ලැබූ සංතෘෂ්ටියෙන් තමා උසස් කොට නොසලකයි. අනුන් ද පහත්කොට නොසලකයි.

02. කෙබදු පිණ්ඩපාතයක් ලැබුණත් සතුටුවෙයි.

03. කෙබදු සෙනසුනක් ලැබුණත් සතුටුවෙයි.

04. භික්ෂුව භාවනාවෙහි ඇලී සිටී. තණ්හාව ප්‍රහාණයෙහි ඇලී සිටී, තපෝ ගුණය නිසා තමන් උසස් කොට නොසලකන අතර අන්‍යයන් පහත් කොට තැකීම ද සිදු නොකරයි.

මෙම සූත්‍රයෙහි ශාසනස්ථියට හේතු වන භික්ෂුවගේ ජීවිතයේ සාරාංශය දැක්වී තිබේ. සිව්පසය පිළිබඳ ඇලීමක් නොමැතිව සරළ ජීවිතයක් ගෙවමින් භික්ෂු ප්‍රතිපදාව වර්ධනය කරගැනීමේ අගය මින් පෙන්නුම් කෙරේ. මෙය භික්ෂූන්වහන්සේලාගේ වස් වාසය අවසාන සමයේ දේශනා කළ වටිනා සූත්‍ර ධර්මයක් වශයෙන් හැඳින්වෙයි. මෙම සූත්‍රය දේශනා කිරීම වෙනුවෙන් ම වෙන් වූ අරියවංස භාණක නමින් භික්ෂූන් වහන්සේලා පිරිසක් වැඩ සිටි බවට ද සාධක තිබේ (දිසානායක, 2019, පි.79).

සැලකිය යුතු තරමේ ශිලාලේඛන සමුදායක ම මෙම උත්සවය පිළිබඳ තොරතුරු ගැබ්ව තිබේ. තෝනිගල සෙල්ලිපියෙහි ඇමති මණ්ඩලයේ සාමාජිකයෙකු වූ සිවගේ පුත් දේව නම් තැනැත්තෙකු විසින් මෙම උත්සවය සඳහා අනුග්‍රහයක් කළ බැව් දැක්වී ඇත. එම ලිපියෙහි මෙය ''අරියවස කරවන මහබිකු සඟනට'' යනුවෙන් දක්වා ඇත (අමරවංශ හිමි, 1969, පි.139). ලබුඇටබැදිගල ලිපියෙහි සිරිනක නම් තැනැත්තෙකු කහවණු සියයක්ද, නටලවිටියසිව නම් තැනැත්තෙකු කහවණු විස්සක් ද මෙම සූත්‍ර දේශනා උත්සවය වෙනුවෙන් තැන්පත් කළ බැව් දැක්වී ඇත (DIAS, 1991, P.73).

නෙලුම්පත් පොකුණ ශිලාලේඛනයෙහි කොසගල නම් විහාරයක සිදු කෙරන අරියවංස උත්සවය සඳහා දෙන ලද අනුග්‍රයක් පිළිබඳ කරුණු දැක්වී තිබේ. අංගමුව ශිලාලේඛනයෙහි මල අනුල නම් පබ්බත විහාරයක පැවති අරියවංස උත්සවය සඳහා නායක කුඹලකුගේ බිරිද වූ අබක නමැති උපාසිකාවක කළ පරිත්‍යාගයක් පිළිබඳ දැක්වී තිබේ (ප්‍රියංක, 2015, පි.53). රජගල ශිලාලිපියක තිස මහ විහාරයෙහි අරියවංස උත්සවය සිදු කිරීම සඳහා කහවනු තැන්පත් කිරීමක් පිළිබඳ දැක්වී ඇත. උද්ධකන්දර ශිලාලිපියක නකරගලක මහා විහාරයෙහි අරියවංස උත්සවය කරන පිරිසට අවශ්‍ය වියදම් සිදු කරගැනීම සඳහා කහවනු තැන්පත් කිරීමක් පිළිබඳ දැක්වී ඇත. මඩවල ශිලාලේඛනයෙහි අරියවංස උත්සවය පැවැත්වීම සඳහා වී පරිත්‍යාග කිරීමක් පිළිබඳ සඳහන් ව ඇත (එම, පි.54).

හය වන සියවසට අයත් සිතුල්පව්ව ශිලාලේඛනයක ද මහාපවාරණයෙහි දී පවත්වන ලද අරියවංස දේශනයක් පිළිබඳ ව දැක්වී තිබේ. එසේ ම තිස්සමහාරාම ප්‍රදේශයෙහි වෙහෙරකෙම නම් ස්ථානයේ ඇති ශිලාලේඛන දෙකක ද අරියවංස දේශනාව පැවති බැව් අනුමාන කළ හැකි තොරතුරු පවතී. ඒ හැරුණු විට පීලිගම, බෝවත්තේගල, ලබුඇටබැදිගල හා සිතුල්පව්ව ආශ්‍රිත ස්ථානවල තවත් ශිලාලේඛන කිහිපයක් තුළ ද අරිවංස සූත්‍ර දේශනා උත්සවය පිළිබඳ තොරතුරු සඳහන් ව තිබේ (ප්‍රියංක, 2019, පි.46,50,51).

**නිගමනය**

කලක් සමාජයෙහි ඉතා ජනප්‍රියව පැවති මෙම සූත්‍ර දේශනාවෙහි ජනප්‍රියතාව ගිලිහී ගොස් ඇත්තේ කිනම් කාලවකවානුවක් තුළ ද යන්න නිශ්චිත නොවේ. එසේ වුවද අද්‍යතනයේ දී ද මෙය ඉතා අඩු වශයෙන් මෙරට පැවැත්වෙන ධර්ම දේශනා උත්සවයක් වශයෙන් හැඳිනගත හැකි ය.

මෙම උත්සවය පිළිබඳ ශිලාලේඛන ආශ්‍රිත තතු හැදෑරීමේ දී භාරතීය සන්දර්භයේ ආරම්භ වූ මෙය පසුව මෙරටෙහි ද ක්‍රියාත්මක වී ඇති බව දිස්වේ. මෙහි ඇති විශේෂත්වය වන්නේ මෙම උත්සවය භික්ෂූන් වහන්සේලා වස් වාසය කොට එහි අවසානය සිදුවන පොහෝ දිනයෙහි විශේෂ උත්සවයක් වශයෙන් පවත්වා තිබීමය.

මෙම උත්සවය සමාජීය, ආගමික හා සංස්කෘතික වශයෙන් පැරණි සමාජයෙහි පැවති ලක්ෂණ පිළිබඳ ව හැදෑරීම සම්බන්ධයෙන් ද වැදගත් වන්නකි. විවිධ සමාජ ස්ථර නියෝජනය කළ පිරිස් මෙම උත්සවය පැවැත්වීම සඳහා අනුග්‍රහ දක්වා තිබේ. සමාජීය වශයෙන් භික්ෂූන් වහන්සේලා පිළිබඳ ව පැවති ආකල්ප හා භික්ෂු සමාජයෙහි හැසිරීම

පිළිබඳ ව ද මේ තුළින් තතු හෙළිවෙයි. ආගමික වශයෙන් මෙහි ඇති වැදගත්කම වන්නේ එකල සමාජයෙහි වැදගත්කමින් ඉහළම ස්ථානයක් මේ සඳහා හිමිව පැවතීමයි. ඒ නිසාම සූත්‍ර ධර්ම දේශනාවක් වුව ද මෙය උත්සවාකාරයෙන් සිදුකර ඇත. සංස්කෘතික වශයෙන් මෙහි ඇති වැදගත්කම වන්නේ අස්පර්ශිත සංස්කෘතියෙහි ප්‍රධාන ස්ථානයක් ව පැවතීමයි. එසේ ම ඒ හා සම්බන්ධව වෙනම උත්සව සිරි ගැන්වීමක් ද සිදුව තිබේ.

**මුඛ්‍ය පද:** අරියවංස උත්සවය, අස්පර්ශිත, ශිලාලේඛන, සාහිත්‍ය මූලාශ්‍ර, වස් විසීම සංස්කෘතිය

## ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංසය*, (2003), සංස් - සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අදිකාරම්, ඊ.ඩබ්, (1963), *පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය*, දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

අමරවංශ හිමි, කොත්මලේ, (1969), *ලක්දිව සෙල්ලිපි*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

දිසානායක, නිලන්ත, (2019), *ලාංකේය බුදු දහමේ පුද පූජා*. කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රියංක, බෙනිල්, (2015), *ක්‍රිස්තු වර්ෂ 1,2,3 සියවස්හි ලක්දිව සෙල්ලිපි ඇසුරෙන් සකස් කරන ලද දත්ත.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ප්‍රියංක, බෙනිල්, (2019), *ක්‍රිස්තු වර්ෂ 4,5,6,7 සියවස්හි ලක්දිව සෙල්ලිපි ඇසුරෙන් සකස් කරන ලද දත්ත.* කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මේධානන්ද හිමි, දේවාලේගම, (2006), *බුදු දහම හා එහි සංස්කෘතික මුහුණුවර.* දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශන.

රාහුල හිමි, වල්පොල, (1962), *ලක්දිව බුදුසමයේ ඉතිහාසය*, කෝට්ටේ: වල්පොල රාහුල පදනම් භාරය.

වික්‍රමසූරිය, ඩී.ඊ, (1929), *ශිලාලේඛන සංග්‍රහය.* කොළඹ: ස්වදේශ මිත්‍රයා මුද්‍රණාලය.

විමලවංස හිමි, බද්දේගම, (1964), *අපේ සංස්කෘතිය.* කොළඹ: සමයවර්ධන පොත්හල.

DIAS, MALANI, (1991), *EPIGRAPHICAL NOTES*, Nos. 1-18, Colombo: Department of Archaeology.